**ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල - 2018**

----------------------------------------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම්

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
-------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
----------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම.
---------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි 4.1.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වත්කම් එහි ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීරණ ආදායමක් හරහා සාධාරණ වටිනාකම, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම යනාදී වශයෙන් වර්ගකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් වටිනාකම රු.10,232,401,250 ක් වූ මූල්‍ය වත්කම් එසේ දක්වා නොතිබුණි. | 2019 වර්ෂයේ ගිණුම් ඒ අනුව පිළියෙළ කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ක්ෂය ප්‍රතිපත්තිය අනුව දේපළ, පිරියත හා උපකරණ එම වත්කම ප්‍රයෝජනයට ගැනීම ආරම්භ කළ දිනයේ සිට ක්ෂය කළ යුතු වුවත් 2018 වර්ෂය තුළ මිලදී ගත් පිරියත හා උපකරණ මිලදී ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර තිබීම නිසා රු.181,457 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ක්ෂය ගණනය කිරීමේ දී සිදු වූ දෝෂයකි. 2019 ගිණුම් පිළියෙළ කිරීමේ දී නිවැරදි කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාල වෛද්‍ය හා හදිසි අනතුරු රක්ෂණ වියදම රු.87,500 ක් වුවද, ඉදිරියට කළ ගෙවීම රු.360,572 ක් ඇතුළත් සමාලෝචිත වර්ෂයේ වියදම් රු.448,072 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2019 වර්ෂයේ දී නිවැරදි කරනු ලැබේ. | ඉදිරියට කල ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2013 වර්ෂයේ සිට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරමින් පවතී. | ඒකාබද්ධ ගිණුම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) 2005 වර්ෂයේදී වටිනාකම රු.12,460,179 කට ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලඹේ පිහිටි අක්කර 25 ක ඉඩම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සමඟ පවතින ගැටලුව නිසා ඉඩම තක්සේරු කිරීමට නොහැකි වී ඇත. | ඉඩම සම්බන්ධයෙන් ඇත්තේ බදු ගිවිසුමක් වේ. එබැවින් තක්සේරු කර වර්තමාන අගය ගිණුම් ගත කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | තොරතුරු තාක්ෂණ ආයතනය සමඟ කල්බදු පදනම යටතේ ගිවිසුමකට එළඹ තිබූ අතර, සමාලෝචිත වර්ෂය වන විටත් එම ඉඩම වර්තමාන වටිනාකමට අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | | |
| (ඇ) | සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11(1)(ආ) වගන්තිය ප්‍රකාරව මහපොළ භාර අරමුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවීමේදී සිදුකර තිබූ ආයෝජන ප්‍රතිශතයට අනුපාතික අතිරික්තය ප්‍රේෂණය කළ යුතුයි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ අතිරික්තයෙන් භාර අරමුදලට හිමි කොටස රු.1,093,798,978 ක් වුවද එය රු.189,198,591 ක් අඩුවෙන් රු. 904,600,387ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවලද දක්වා තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් භාර අරමුදලට ලැබුණ ප්‍රමාණය ගිණුම්ගත කර ඇත. හිමිවිය යුතු ලාභ ප්‍රමාණය පිළිබඳ නිශ්චිත එකඟතාවයක් නැත. | නිශ්චිත එකඟතාවයකට එළඹිය යුතුය. |
| (ඉ) | 2012 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අතිරික්තයෙන් භාර අරමුදලට ලැබිය යුතුව තිබූ නමුත්, ජනාධිපති අරමුදල විසින් එවා නොතිබූ රු. 835,766,892 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් භාර අරමුදලට ලැබුණ ප්‍රමාණය ගිණුම්ගත කර ඇත. හිමිවිය යුතු ලාභ ප්‍රමාණය පිළිබඳ නිශ්චිත එකඟතාවයක් නැත. | නිශ්චිත එකඟතාවයකට පැමිණ මූල්‍ය පුකාශනවලට අවශ්‍ය ගැලපීම් කළ යුතුය. |

## 1.6 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු.3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිවෙකු ඉල්ලුම් කර නොමැති බැවින් එය නිශ්චිතව ම ගෙවිය යුතු බවට හඳුනා ගෙන නොතිබුණි. | කිසිවෙකු ඉල්ලුම් කර නොමැත. ඒ පිළිබඳ වාර්තාවන් ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2019 ජූලි 31 දිනදීය. | ඉදිරියට එවැනි ප්‍රමාදවීම් සිදු නොවනු ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.451,560,612 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.227,539,892 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.679,100,504 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබුණු රු.904,600,387 ක ලාභ කොටස ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගවලින් ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 67 ක වර්ධනයක් පෙන්නුම් කල අතර, මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේ සියයට 100 ක් වැඩියෙන් ලැබීම හේතු වී තිබුණි.

(ආ) වෙනත් ආදායම් මාර්ගවලින් ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 29 කින් වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධ්‍යාපනය සැලසීම නිරත වන පාසල්, ආයතන, පදනම් සහ එවැනි ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම, වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි වෘත්තීය අභ්‍යාස, ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහයවීම, අධ්‍යාපනය සැලසීමේ නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලැසීම යන භාර අරමුදල් පනතේ 6.1 වගන්තියේ සඳහන් අරමුණු ඉටුකිරීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් අවධානය යොමුකර නොතිබුණි. | පනතේ සඳහන් සියළුම අරමුණු ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් මුදල් භාර අරමුදල සතුව නොමැත. | පනතේ ප්‍රකාරව අරමුදල් සම්පාදනය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම (SLIIT) සමඟ 2005 නොවැම්බර් 14 සහ 2015 මැයි 12 දින එළඹි ගිවිසුම් සහ 2017 අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් | නිර්දේශ සඳහා අනුමැතිය ලැබීමෙන් පසු කටයුතු කරමි. | අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකල යුතුය. |

| | | |
|---|---|---|
| කල අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අනුමැතිය අනුව භාර අරමුදලට SLIIT ආයතනය සම්බන්ධයෙන් තිබූ අයිතිය අහිමි කර තිබුණි. තව ද 2015 එළඹී ගිවිසුම නීතියානුකූල නොවන බවට අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමේ හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිසම යටතේ විමර්ශන 2 ක් විභාග වෙමින් පැවැති අතර 2019 ජූලි 12 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම්කාරක සභා රැස්වීමේ දී SLIIT ආයතනය සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සහ භාර අරමුදලේ සභාපති වෙත දන්වා තිබූ අතර 2019 අගොස්තු 02 දින එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබූ නමුත් එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කටයුතු කිරීම සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | | |
| (ඇ) 2018 සැප්තැම්බර් 05 දිනැති අංක අමප/18/1873/824/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව භාර අරමුදල නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ එළඹී ආයෝජන කළමනාකරණ ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ අනුව 2019 පෙබරවාරි 28 දින නැෂනල් වෙල්ත් කෝපරේෂන් විසින් කළමනාකරණය කරන ලද ආයෝජන කළඹ ලංකා බැංකු ආයතනික ශාඛාවේ මහපොළ භාර අරමුදල සතු ප්‍රධාන ගිණුම වෙත මාරු කර තිබුණි. තවද එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඇවර කිරීම හා නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම විකිණීම සිදුකල යුතු වුවත් මෙතෙක් එය සිදුකර නොතිබුණි. | සමාගම්වල තක්සේරු කිරීම් සිදුකර ඇත. අවශ්‍ය කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් සිටිමි. | අමාත්‍ය මණ්ඩල තීරණය කඩිනමින් ක්‍රියාත්මක කල යුතුය. |
| (ඇ) ඉහත (ඇ) සඳහන් කටයුතු නොකර මහපොළ භාර අරමුදල විසින් ලංකා බැංකුවෙන් ලබාගත් රු.බිලියන 4 ක ණය පහසුකමක් මත ලබාගත් රු.බිලියන 1.111 ක ණය මුදලෙන් | සමාගම්වල තක්සේරු කිරීම් සිදුකර ඇත. අවශ්‍ය කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් සිටිමි. | අමාත්‍ය මණ්ඩල තීරණය කඩිනමින් ක්‍රියාත්මක කල යුතුය. |

| | | |
|---|---|---|
| නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගමේ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් 2019 මාර්තු 26 දින මිල දී ගෙන නැවත එය 2019 මාර්තු 27 දින රු.බිලියන 1.113 කට විකුණා තිබූ අතර එම මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර 2019 ජුනි 27 දින එම ණය පියවා තිබුණි. | | |
| (ඉ) භාර අරමුදල් පනතේ 6.2(අ) (ඇ) (ඈ) වගන්ති අනුව මුදල් සපයා ගැනීම සඳහා දේශීය හෝ විදේශීය මූලාශ්‍ර වලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන ,තෑගී හෝ පරිත්‍යාග භාර ගැනීමට හා ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ලොතරැයි පැවැත්වීමට බලය භාර අරමුදලට ලැබී තිබූ නමුත් එවැනි මූලාශ්‍ර මඟින් අරමුදල් සපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. විශ්ව විද්‍යාල සිසුන් සඳහා ලබා දෙනු ලබන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වය සඳහා ආරම්භයේ දී සම්පූර්ණ දායකය මහපොළ භාර අරමුදලින් සිදුකළ ද පසුකාලීනව ඉන් සියයට 49 ක දායකත්වයක් රජයෙන් සිදුකර තිබුණි. | ඉදිරියේ දී කිරීමට යෝජනා කර ඇත. | අරමුදල් සම්පාදනය කර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.2 ප්‍රසම්පාදය**

--------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සෑම ප්‍රසම්පාදන අස්ථිත්වයක් විසින්ම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු අතර එහි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් අරමුදල විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේ දී සිදු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්යමණ්ඩලය 26 ක් වුවත් සත්‍ය කාර්යමණ්ඩලය 14 ක් වූයෙන් තනතුරු 12 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් තෘතීය මට්ටමේ තනතුරු 06 ක්ද ද්විතීය මට්ටමේ තනතුරු 03 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක්ද පුරප්පාඩුව පැවතිණි. එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාකර නොතිබුණි. | බඳවා ගැනීම් සිදු කරමින් පවතී. | අදාල තනතුරු හඳුනා ගෙන එම පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |